විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

விஞ்ஞான, தொழில்நுட்பவியல் மற்றும் ஆராய்ச்சி அமைச்சு

Ministry of Science, Technology and Research



# 2015

## වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## வருடாந்த செயல்திறன் அறிக்கை

## Annual Performance Report

## පටුන

පිටු අංක


**1. පැතිකඩ** **2**

1.1 අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක

ව්‍යවස්ථාපිත ආයතනයන්හි කාර්යයන් පැවරීම 2

1.2 අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යා විස්තරය 3

**2. 2015 කාර්යසාධනය** **4**

2.1 පෞද්ගලික වේතන සහ වෙනත් අමාත්‍යාංශයීය පුනරාවර්තන වියදම්

2.2 අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදම් 4

2.3 ආයතනයන්හි මුළු පුනරාවර්තන වියදම් 5

2.4 විසර්ජන ගිණුම් හා අදාළව ප්‍රාග්ධන වැය ශීර්ෂ 5

2.5 අත්තිකාරම් ගිණුම් හා අදාළව නියම කළ සීමාවන්ට එරෙහිව සත්‍ය සීමාවන් 7

**3. 2015 සඳහා වාර්ශික කාර්ය සැලසුම් ඉලක්කයන් සහ ජයග්‍රහණ** **8**

3.1 විද්‍යාත්මක සංවර්ධන වැඩසටහන 8

3.2 ජාතික නිනිති තාක්ෂණ මූලාරම්භය 10

3.3 නව නිපැයුම්කරුවනගේ අරමුදල 12

3.4 තාක්ෂණ හුවමාරුව - විදාතා වැඩසටහන 14

## පෙර දැක්ම

2020 වර්ෂයේ දී විද්‍යාව හා තාක්ෂණයෙන් උසස් රටක් බවට ශ්‍රී ලංකාව පත්කිරීම.

## මෙහෙවර

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනයට අත්‍යාවශ්‍ය වූ නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම හා ආර්ථික ක්‍රියාදාමයන් පුළුල් කිරීම සඳහා, විද්‍යාත්මක පර්යේෂණ සංවර්ධනය සහ තාක්ෂණ පැවරුම් ඇතුළත්ව විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමට සහ ප්‍රචලිත කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.

## හැඳින්වීම

2015 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම්හි ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම්හි ප්‍රගතිය මෙම වාර්තාව සඳහා ඇතුළත් වේ. අංක 01/2004 සහ 24/02/2004 දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 3.2 වගන්තියෙහි "වාර්ෂික කාර්ය සාධන වාර්තාව" යටතේ දක්වා ඇති මාර්ගෝපදේශයන් හා අනුකූලව මෙම වාර්තාව සකස් කෙරිණි.

2015 වර්ෂය සඳහා අමාත්‍යාංශය වෙත ලබා දී ඇති මුළු පුනරාවර්තන සහ ප්‍රාග්ධන අයවැය වෙන්කිරීම් පිළිවෙළින් රු. මිලියන 1,467.350 සහ රු. මිලියන 2,256.550 ක් වේ. වෙන්කර දී ඇති මුළු ප්‍රතිපාදනයන්ගෙන් 2015 වර්ෂය තුළදී, පුනරාවර්තන වියදම් ලෙස රු. මිලියන 1425.78 ක් සහ ප්‍රාග්ධන වියදම් ලෙස රු. මිලියන 1722.351 ක මුදලක් ද වැය වී ඇත.

ජාතික සංවර්ධන අභිමතාර්ථයන් සපුරාගැනීමේ ක්‍රියාවලියේදී, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය වෙත සුවිශේෂී කාර්යභාරයක් පැවරී ඇති අතර එහිදී ඉල්ලුම මත පදනම් වූ පර්යේෂණයන්හි නියැළීම, පර්යේෂණ වාණිජකරණය, නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රවර්ධනය, ප්‍රමිතීන් සහ සහතිකකරණයන් සඳහා පහසුකම් සැපයීම යනාදිය සඳහා රාජ්‍ය පර්යේෂණ ආයතනයන් යොමුකිරීම අපේක්ෂා කෙරේ. ජාතික සංවර්ධන අභිමතාර්ථයන් සමඟ පර්යේෂණ අනුගත කරගැනීමේ මූලික ප්‍රතිපත්තිය සහතික කර ගනු වස්, අමාත්‍යාංශය විසින් පර්යේෂණ, පර්යේෂණ අරමුදල් සහ සංවර්ධන ප්‍රමුඛතාවයන් අතර සබඳතාවයක් ස්ථාපනය කිරීම සඳහා ඉහළම ප්‍රමුඛතාව ලබදීම සඳහා අඛණ්ඩව පියවර ගනු ලැබිණි.

2014 වසරේදී සම්පූර්ණ කරනු ලැබූ ජාතික පර්යේෂණ සහ සංවර්ධන ආයෝජන රාමුව මත පදනම්ව, ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛතා පර්යේෂණ ක්ෂේත්‍රයන් තෝරාගනු ලැබිණි.

මෙම රාමුව ඵලදායී අයුරින් ක්‍රියාත්මබ කිරීම සහතික කිරීම සඳහා, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම සමඟ සහයෝගීතාවයෙන් මෙම රාමුව මත පදනම් වූ කාලරාමුවක් සහිත විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් සකස් කෙරෙනු ඇත. ක්‍රියාකාරී සැලැස්ම සකස් කෙරෙනතෙක්, ජලය හා අදාළ පර්යේෂණයන් සඳහා ප්‍රමුඛතාවය ලබාදීමට අමාත්‍යාංශය විසින් පියවර ගනු ලැබූ අතර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක අනෙකුත් පර්යේෂණ ආයතනයන් විසින් සිය ආයතනයන් වෙත නියෝගාත්මකව පැවරී ඇති කාර්යභාරයන් සහ ජාතික පර්යේෂණ හා සංර්ධන රාමුව හා අනුගතව හඳුනාගනු ලැබූ ප්‍රමුඛතා පර්යේෂණ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අඛණ්ඩව කටයුතු කෙරිණි. ප්‍රධාන තේමාව වූ ජලය යන තේමාව යටතේ, උග්‍ර වකුගඩු රෝගය වැළදීමේ හේතුකාරකයන් සඳහා විසඳුම් ලබා දීමේ හැකියාව සහිත නැනෝපටල ජල පෙරනයක් සැකසීමේ පර්යේෂණ ව්‍යාපෘතියක් මූල්‍යානය කිරීමට අමාත්‍යාංශයට හැකියාව උදාවූ අතර අමාත්‍යාංශය සමඟ සමඟ සහයෝගීතාවයෙන් සිදුකෙරෙන උග්‍ර වකුගඩු රෝගය සඳහා ජෛව සලකුණු කාරකයක් හඳුනාගැනීමේ පර්යේෂණයක් සඳහා NASTEC ආයතනයේ අනුමැතිය ලැබිණි.

විදාතා වැඩසටහනෙහි අඛණ්ඩ වර්ධනය පිළිබඳව මෙන්ම පූර්ව වර්ෂයේ සිට ආරම්භ කරන ලද විදාතා නිෂ්පාදන සහතිකකරණය, විදාතා ව්‍යවසායකයින් බිහිකිරීම, මූල්‍යානය සහ වෙළඳපළ සඳහා ප්‍රවේශ මාර්ගයන් සපයාදීම වැනි මූලාරම්භයන් කිහිපයක් පිළිබඳවද අමාත්‍යාංශයෙහි අවධානය යොමුවිණි.

පර්යේෂණ ආයතනයන්හි පර්යේෂණ හා සංවර්ධන ධාරිතාවන් සවිමත් කිරීම සඳහා පවත්නා කාර්යාල සහ විද්‍යාගාර පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් නව විද්‍යාගාරයන් ස්ථාපනය කිරීම සඳහා පියවර ගනු ලැබිණි. උසස් තත්ත්වයේ තාරකා විද්‍යාත්මක අනුකරණයන් අර්ධගෝලාකාර තිරය මත නිශ්චිත ගණිතමය නිරවද්‍යතාවයෙන් යුක්තව විදහා දැක්වීම සඳහා 4D පූර්ණ අර්ධගෝලාකාර ප්‍රක්ෂේපන පද්ධතියක් ග්‍රහලෝකාගාරය වෙත සපයා දෙනු ලැබ ඇත. ජාතික විද්‍යා මධ්‍යස්ථානයෙහි එක් සංරචකයක් ලෙස හඳුනාගනු ලැබ ඇති තාක්ෂණ බීජෞෂණ මධ්‍යස්ථානයෙහි ඉදිකිරීම් කටයුතු 2015 වසරේදී සම්පූර්ණ කරනු ලැබ ඇති අතර මේ හරහා කර්මාන්ත සහ පුද්ගලයින් සඳහා සිය විද්‍යාගාර මට්ටමේ පර්යේෂණ හා සංවර්ධනයන් නියාමන මට්ටම දක්වා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය බීජෞෂණ පහසුකම් සපයා දෙනු ඇත. විද්‍යා මධ්‍යස්ථානය ඉදිකිරීමේ මූලික අදියර එළැඹෙන වසරේ සිට ආරම්භ කෙරෙනු ඇත.

තවද, ඉන්දියාව, චීනය, බෙලරුස්, ස්ලොවේනියා, ජපානය සහ පාකිස්ථානය යන රටවල් සමඟ ඇති කරගනු ලැබූ ද්විපාර්ශ්වික සබඳතා හරහා සිය ජාත්‍යන්තර සහයෝගීතාවයන් සවිමත්කර ගැනීමට අමාත්‍යාංශය විසින් පියවර ගන්නා ලදී. ඉන්දියාව සහ චීනය සමඟ දැනටමත් ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. චීනය සමඟ සහයෝගීතාවයෙන් ඒකාබද්ධ ජෛවතාක්ෂණ විද්‍යාගාරයක් ස්ථාපිත කිරීම සඳහා කටයුතු කෙරේ. අමාත්‍යාංශයීය පද්ධතියෙහි අඛණ්ඩව සිදුවූ වෙනස්කම් හේතුවෙන් අමාත්‍යාංශයේ වැඩසටහන් සහ ව්‍යාපෘතීන්හි මූල්‍යමය ප්‍රගතිය සඳහා බාධාවන් පැමිණුනද, භෞතික ක්‍රියාකාරකම්හි සැලකියයුතු ප්‍රගතියක් අත්කර ගැනීමට අමාත්‍යාංශය සහ ඒ යටතේ ක්‍රියාත්මක ආයතනයන්ට හැකියාව ලැබිණි.

## පැතිකඩ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වගන්තිය 44(1) (අ) යටතේ අතිගරු ජනාධිපතිතුමන් විසින් සිදුකරනු ලැබූ විෂයයන් හා කාර්යයන් පැවරීම හා අනුකූලව 2015 සැප්තැම්බර් 21 දිනැති අංක 1933/10අරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනයන්ගේන් සංශෝධිත පහත සඳහන් විෂයයන්, කාර්යයන් සහ ආයතනයන්, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යවරයා වෙත පැවරේ.

## 1.1 අමාත්‍යාංශයේ කාර්යයන්

1. විද්‍යාව, තාක්ෂණය සහ පර්යේෂණ යන විෂයයන්ට අදාළව සහ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාරතමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා යනාදිය යටතට ගැනෙන විෂයයන් හා අදාළව ප්‍රතිපත්තීන්, වැඩසටහන් සහ ව්‍යාපෘතීන් සම්පාදනය, ඒවා සුපරීක්ෂණය සහ ඇගැයීමට ලක්කිරීම.
2. ජාත්‍යන්තර වශයෙන් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයහි සිදුකරනු ලැබූ පර්යේෂණයන් ඇසුරෙන් ලත් නව සොයාගැනීම් සහ පර්යේෂණ සිදු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා දීම.
3. විද්‍යාත්මක, කාර්මික සහ සංවර්ධන ක්‍රියාකාරකම් පුළුල් කිරීම සඳහා පියවර ගැනීම.
4. පර්යේෂණ සැලසුම් කිරීම සහ සිදුකිරීම සඳහා පර්යේෂණ සහ පර්යේෂණ ආයතන වෙත පහසුකම් සලසාදීම.
5. නිනිති සහ ජෛව තාක්ෂණය ඇතුළත්ව, නව පර්යේෂණ සහ සොයාගැනීම් පිළිබඳ තොරතුරු, ව්‍යාපාරික ප්‍රජාව ඇතුළත්ව අදාළ පාර්ශ්වයන් වෙත ලබාදීම.
6. ප්‍රමිතීන් ස්ථාපනය සහ පරිපාලනය හා අදාළ ක්‍රියාකාරකම්.
7. වෙනත් අමාත්‍යාංශ යටතේ පවත්නා පර්යේෂණ ආයතනයන් විසින් පවත්වනු ලබන පර්යේෂණ වැඩසටහන් සඳහා කාර්මික සහාය ලබාදීම.
8. නව සොයාගැනීම් සිදුකිරීම උදෙසා ප්‍රජාවන් වෙත මාර්ගෝපදේශකත්වය ලබා දීම සහ අභිප්‍රේරණය සඳහා පියවර ගැනීම.
9. ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රවර්ධනය සහ සංවර්ධනය සඳහා පර්යේෂණ ක්‍රියාත්මක කිරීම.
10. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන් වෙත පැවරී ඇති වෙනත් සියලුම විෂයයන් හා අදාළ කරුණු.
11. අමාත්‍යාංශය වෙත පැවරී ඇති ආයතනයන්හි සුපරීක්ෂණ කටයුතු.

**ඉහත කාර්යයන් සපුරාලීම සඳහා අමාත්‍යාංශය යටතට පැවරී ඇති ආයතනයන්**

1. නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය
2. කාර්මික තාක්ෂණ ආයතනය
3. ජාතික මූලික අධ්‍යයන ආයතනය
4. ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
5. ජාතික පර්යේෂණ සභාව
6. ජාතික විද්‍යා පදනම
7. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම
8. ශ්‍රී ලංකා අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩලය
9. ශ්‍රී ලංකා නව නිපැයුමකරුවන්ගේ කොමිසම
10. ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය
11. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
12. ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය (පෞද්) සමාගම (ස්ලින්ටෙක්)

## 1.2 සංවිධාන ව්‍යුහය

**පැවරී ඇති වැඩසටහන් පදනම් කොටගෙන අමාත්‍යාංශය අංශ පහකට බෙදා ඇති අතර එම අංශ පහ ආකාර වේ.**

1. ආයතන හා මුදල් අංශය
2. තාක්ෂණ සහ පර්යේෂණ සංවර්ධන අංශය
3. තාක්ෂණ පැවරුම් අංශය
4. ජාතික 3ග්‍රහලෝකාගාරය
5. විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය

## 1.3 අමාත්‍යාංශයේ කාර්යමණ්ඩල විස්තර

| සේවා කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව 2016.06.30 දිනට | සත්‍ය කාර්යමණ්ඩලය 2016.06.30 දිනට |
|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | |
| ස්ථිර | 23 | 21 |
| අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම | 2 | - |
| කොන්ත්‍රාත් පදනම (නැවත සේවයේ යෙදවීම) | - | - |
| **තෘතික මට්ටම** | | |
| ස්ථිර | 28 | 3 |
| අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම | 1 | 1 |
| කොන්ත්‍රාත් පදනම (නැවත සේවයේ යෙදවීම) | - | - |
| **ද්විතීක මට්ටම** | | |
| ස්ථිර | **742** | **655** |
| අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම | **1** | **19** |
| කොන්ත්‍රාත් පදනම (නැවත සේවයේ යෙදවීම) | **-** | **-** |
| **ප්‍රාථමික මට්ටම** | | |
| ස්ථිර | **235** | **306** |
| අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම | **-** | **-** |
| කොන්ත්‍රාත් පදනම (නැවත සේවයේ යෙදවීම) | **-** | **-** |
| **එකතුව** | **1032** | **1005** |

# 2. 2015 කාර්යසාධනය

## 2.1 අමාත්‍යාංශ සහ ආයතනයන්හි මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | ප්‍රතිපාදනය | | වියදම | |
|---|---|---|---|---|
| | පුනරාවර්තන (රු. මිලියන) | ප්‍රාග්ධනය (රු. මිලියන) | පුනරාවර්තන (රු. මිලියන) | ප්‍රාග්ධනය (රු. මිලියන) |
| අමාත්‍ය කාර්යාලය | **6.950** | **3.000** | **5.177** | **1.280** |
| ආයතන සහ පරිපාලන සේවා | **130.672** | **19.050** | **123.016** | **6.756** |
| විද්‍යා හා තාක්ෂණ සංවර්ධන වැඩසටහන | **423.800** | **721.450** | **410.576** | **604.756** |
| ජාතික ග්‍රහලෝකාගාරය | **18.403** | **91.700** | **16.128** | **22.358** |
| ආයතනයන් | **920.523** | **1421.350** | **870.883** | **10870642** |

## 2.2 අමාත්‍යාංශයේ පෞද්ගලික වේතන සහ වෙනත් පුනරාවර්තන වියදම්

අමාත්‍යාංශය : විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ

ශීර්ෂ අංක : 196

කාණ්ඩය - පෞද්ගලික වේතන සහ වෙනත් පුනරාවර්තන

| විස්තරය | වෙන්කිරීම (රු. මිලියන) | මුළු වියදම (රු. මිලියන) | ශේෂය (රු. මිලියන) |
|---|---|---|---|
| | | | |
| අමාත්‍ය කාර්යාලය | | | |
| පෞද්ගලික වේතන | 3.350 | 2.706 | .644 |
| වෙනත් පුනරාවර්තන | 3.600 | 2.471 | 1.129 |
| **මුළු එකතුව** | **6.950** | **5.177** | **1.773** |
| | | | |
| පාලන සහ ආයතන සේවා | | | |
| පෞද්ගලික වේතන | 50.712 | 50.107 | .605 |
| වෙනත් පුනරාවර්තන | 79.960 | 72.909 | 7.051 |
| **මුළු එකතුව** | **130.672** | **123.016** | **7.656** |
| | | | |
| විද්‍යා හා තාක්ෂණ සංවර්ධන වැඩසටහන් | | | |
| පෞද්ගලික වේතන | 362.750 | 362.474 | .276 |
| වෙනත් පුනරාවර්තන | 61.050 | 48.102 | 12.948 |
| **මුළු එකතුව** | **423.800** | **410.576** | **13.224** |
| | | | |
| ග්‍රහලෝකාගාරය | | | |
| පෞද්ගලික වේතන | 7.828 | 7.189 | .639 |
| වෙනත් පුනරාවර්තන | 10.575 | 8.939 | 1.636 |
| **මුළු එකතුව** | **18.403** | **16.939** | **2.275** |
| | | | |
| එකතුව | **579.825** | **554.897** | **24.928** |

## 2.3 ආයතනයන්හි මුළු පුනරාවර්තනයන්

අමාත්‍යාංශය : විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ
ශීර්ෂ අංකය : 196
කාණ්ඩය - පෞද්ගලික වේතන සහ වෙනත් පුනරාවර්තන

| විස්තරය | වෙන්කිරීම් (රු. මිලියන) | මුළු වියදම (රු. මිලියන) | ශේෂය (රු. මිලියන) |
|---|---|---|---|
| **රාජ්‍ය ආයතන** | | | |
| නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය | 111.500 | 111.500 | 0 |
| මූලික අධ්‍යයන ආයතනය | 164.804 | 154.000 | 10.804 |
| කාර්මික තාක්ෂණ ආයතනය | 230.000 | 230.000 | 0 |
| ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය | 220.000 | 198.184 | 21.816 |
| ජාතික පර්යේෂණ සභාව | 19.000 | 16.852 | 2.148 |
| ජාතික විද්‍යා පදනම | 106.032 | 106.032 | 0 |
| ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම | 20.187 | 19.795 | .392 |
| ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය | 17.000 | 12.208 | 4.792 |
| ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම | 32.000 | 22.312 | 9.688 |
| **මුළු එකතුව** | **920.523** | **870.883** | **49.640** |

### 2.3.1 විසර්ජන ගිණුම් හා අදාලව ප්‍රාග්ධන වැය ශීර්ෂ

### 2.4.1 අමාත්‍යාංශය : විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ

ශීර්ෂ අංක : 196

කාණ්ඩය: පුනරුත්ථාපනය සහ අත්කරගැනීම

| විස්තරය | වෙන් කිරීම් (රු. මිලියන) | මුළු වියදම (රු. මිලියන) | ශේෂය (රු. මිලියන) |
|---|---|---|---|
| | | | |
| **අමාත්‍ය කාර්යාලය** | | | |
| පුනරුත්ථාපන | 1.000 | .430 | .570 |
| අත්කරගැනීම් | 2.000 | .850 | 1.150 |
| වෙනත් | | | |
| **මුළු වියදම්** | **3.000** | **1.280** | **1.720** |
| | | | |
| **පාලන සහ ආයතන සේවාවන්** | | | |
| පුනරුත්ථාපන | 3.050 | 1.986 | 1.064 |
| අත්කරගැනීම් | 8.000 | 3.907 | 4.093 |
| ධාරිතා ගොඩනැගීම | 2.500 | .863 | 1.637 |
| දැයට කිරුළ | 5.500 | 0 | 5.500 |
| | | | |
| **මුළු එකතුව** | **19.050** | **6.756** | **12.294** |
| **එකතුව** | **22.050** | **8.036** | **14.014** |

**2.4.2** අමාත්‍යාංශය : විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ

ශීර්ෂ අංක : 196

කාණ්ඩය : පුනරුත්ථාපන සහ අත්කරගැනීම්

| විස්තරය | වෙන්කිරීම (රු. මිලියන) | මුළු වියදම (රු. මිලියන) | ශේෂය (රු. මිලයන) |
|---|---|---|---|
| විද්‍යා හා තාක්ෂණ සංවර්ධන වැඩසටහන් | | | |
| **1.විද්‍යාතා වැඩසටහන** | | | |
| පුනරුත්ථාපනය | 4.450 | 2.781 | 1.669 |
| අත්කරගැනීම් | 54.000 | 42.578 | 11.422 |
| දැනුම පවරාදීමේ වැඩසටහන | 35.000 | 25.288 | 9.712 |
| **මුළු එකතුව** | **93.45** | **70.647** | **22.803** |
| **2.විද්‍යාත්මක සංවර්ධන වැඩසටහන** | | | |
| ආයෝජනයන් | 0 | 0 | 0 |
| විද්‍යා හා තාක්ෂණ ප්‍රචලිත කිරීමේ වැඩසටහන | 6.000 | 3.012 | 2.988 |
| විද්‍යාත්මක පුහුණුව | 8.000 | 7.044 | .956 |
| වෙනත් රටවල් සමඟ විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාවයන්ට එළැඹීම | 26.000 | 20.422 | 5.578 |
| **මුළු එකතුව** | **40.000** | **30.478** | **9.522** |
| | | | |
| **3.නිනිති තාක්ෂණ මූලාරම්භය** | | | |
| ආයෝජනයන් | 340.000 | 339.600 | .400 |
| **මුළු එකතුව** | **340.000** | **339.600** | **.400** |
| | | | |
| **4.තාක්ෂණ ව්‍යවසායකත්ව සංවර්ධනය** | | | |
| ආයෝජනයන් | 8.000 | 4.801 | 3.199 |
| **මුළු එකතුව** | **8.000** | **4.801** | **3.199** |
| | | | |
| **5.පර්යේෂණ හා සංවර්ධන ආයෝජන රාමුව ක්‍රියාත්මක කිරීම** | | | |
| ආයෝජනයන් | 85.000 | 4.875 | 80.125 |
| **මුළු එකතුව** | **85.000** | **4.875** | **80.125** |
| | | | |
| **6.උග්‍ර වකුගඩු රෝගය ලිහිල් කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම** | | | |
| ආයෝජනයන් | 5.000 | 3.914 | 1.086 |
| **මුළු එකතුව** | **5.000** | **3.914** | **1.086** |
| | | | |
| **7.ජාතික විද්‍යා මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම** | | | |
| ආයෝජනයන් | 150.000 | 150.000 | 0 |
| **මුළු එකතුව** | **150.000** | **150.000** | **0** |
| | | | |
| **8.ග්‍රහලෝකාගාරය** | | | |
| පුනරුත්ථාපන | 35.500 | 2.586 | 32.914 |
| අත්කරගැනීම් | 31.000 | 1.073 | 29.927 |
| 4D ඩිජිටල් ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් | 25.000 | 18.695 | 6.305 |
| මානව සම්පත් සංවර්ධනය | .200 | .004 | .196 |
| **මුළු එකතුව** | **91.700** | **22.358** | **69.342** |
| **එකතුව** | **813.150** | **626.673** | **186.477** |

### 2.4.3 ආයතනයන්හි ප්‍රාග්ධන වියදම් - 2015

අමාත්‍යාංශය : විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ

ශීර්ෂ අංක : 196

කාණ්ඩය : පුනරුත්ථාපන සහ අත්කරගැනීම් සහ වෙනත් ප්‍රාග්ධන වියදම්

| විස්තරය | වෙන්කිරීම (රු. මිලියන) | මුළු වියදම (රු. මිලියන) | ශේෂය (රු. මිලියන) |
|---|---|---|---|
| රාජ්‍ය ආයතන | | | |
| නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය | 100.000 | 62.959 | 37.041 |
| මූලික අධ්‍යයන ආයතනය | 140.000 | 136.001 | 3.999 |
| කාර්මික තාක්ෂණ ආයතනය | 420.000 | 298.564 | 121.436 |
| ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය | 65.000 | 43.569 | 21.431 |
| ජාතික පර්යේෂණ සභාව | 330.000 | 277.500 | 52.500 |
| ජාතික විද්‍යා පදනම | 290.000 | 234.800 | 55.500 |
| ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම | 20.00 | 2.729 | 17.271 |
| ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය | 3.000 | 1.250 | 1.750 |
| ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම | 53.350 | 30.270 | 23.080 |
| **මුළු එකතුව** | **1421.350** | **1087.642** | **333.708** |

## 2.5 නියම කරනු ලැබූ සීමාවන්ට එරෙහිව සත්‍ය සීමාවන්

(අත්තිකාරම් ගිණුම් හා අදාළව)

| රජයේ ක්‍රියාකාරකම්හි උපරිම වියදම් සීමාවන් (ශ්‍රී. ලං. රු.) | රජයේ ක්‍රියාකාරකම් ඇසුරෙන් ලද ලැබීම් හි උපරිම සීමාවන් (ශ්‍රී. ලං. රු.) | රජයේ ක්‍රියාකාරකම්හි උපරිම හරශේෂ සීමාවන් (ශ්‍රී. ලං. රු.) |
|---|---|---|
| 25,000,000.00 | 10,000,000.00 | 75,000,000.00 |

# 3. 2015 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සැලසුම් ඉලක්ක සහ ජයග්‍රහණ

**තාක්ෂණ සහ පර්යේෂණ සංවර්ධන**

## 3.1 විද්‍යාත්මක සංවර්ධන වැඩසටහන්

### 3.1.1 පර්යේෂණ සහ සංවර්ධන ආයෝජනයන්

අමාත්‍යාංශය විසින් ආයෝජන රාමුවෙහි හඳුනාගනු ලැබූ ප්‍රමුඛතා ක්ෂේත්‍රයන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරනු ලැබූ අතර "ජලය" යන ක්ෂේත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා තෝරා ගනු ලැබ ඇත. රෝග නිදානය හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය (KDU) පිළිබඳ ගැටලුව සඳහා කඩිනමින් විසඳුම් සොයාගැනීමේ ජාතික අවශ්‍යතාවය අවබෝධ කරගනිමින්, ජලය යන තේමාව යටතේ මැදිහත්වීම් සිදු කළ යුතු ප්‍රධාන එක් ක්ෂේත්‍රයක් ලෙස එය හඳුනා ගනු ලැබූ අතර අමාත්‍යාංශය යටතේ ඇති පර්යේෂණ ආයතන වෙතින් ඒ සඳහා යෝජනා කැඳවන ලදී මේ සම්බන්ධයෙන් කාර්මික තාක්ෂණ ආයතනය, ජාතික මූලික අධ්‍යයන ආයතනය සහ ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයනතනය විසින් සිය යෝජනාවන් ඉදිරිපත් කරන ලදී, විශේෂඥයින්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් විසින් මෙම යෝජනාවන් ඇගැයීමට ලක් කරනු ලැබූ අතර එක් යෝජනාවක් ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගනු ලැබිණි. පර්යේෂණ සංවර්ධන ක්‍රියාකාරකම් සුපරීක්ෂණය සඳහා පත්කරන ලද විශේෂඥ කමිටුව ස්ලින්ටෙක් ආයතනය විසින් ඉදිරිපත් කරනු ලැබූ "ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිතීන්ට අනුකූලව පානීය ජලය සපයාගැනීම සඳහා නැනෝ තාක්ෂණය මත පදනම් වූ ජලපෙරණයක් වැඩිදියුණු කිරීම" යන යෝජනාව තෝරාගත් අතර සාකච්ඡා සහ පර්යේෂණ කිහිපයකින් අනතුරුව මෙම පෙරනයෙහි මූලාකෘතිය සකස් කොට දන්නා ද්‍රාවණයක් සහ උතුරු මැද පළාතේ ජල ප්‍රභවයකින් ලබාගත් ජලය යොදාගෙන පරීක්ෂාවන් සිදුකරන ලදී. පර්යේෂණ සඳහා වැයවන මුළු වියදම රු. මිලියන 4කි.

මෙම ව්‍යාපෘතියෙහි පර්යේෂණ සහ සංවර්ධන හා පරීක්ෂාකිරීමේ මූලලේඛයන් සම්පූර්ණ කරනු ලැබ ඇති අතර දත්ත වලංගු කිරීම පිළිබඳ විශේෂඥ කමිටුවෙහි අනුමැතිය අපේක්ෂාවෙන් පසුවේ. අභ්‍යන්තර වලංගු කිරීම සඳහා අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව බාහිර වලංගුකිරීම ලබාගැනීමට අපේක්ෂා කෙරෙන අතර අලෙවිය සඳහා ජල පෙරන වැඩිදියුණු කිරීම අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය පූර්ණ වශයෙන් මූල්‍යනය කිරීම අමාත්‍යාංශය විසින් සිදුකිරීමට අපේක්ෂිතය.

මෙයට අමතරව ජාතික විද්‍යා සහ තාක්ෂණ කොමිසම (NASTEC) විසින් වකුගඩු රෝගය පිළිබඳ ගැටලුව විසඳාලීම සඳහා යෝජනාවන් කැඳවනු ලැබූ අතර, ඒ සඳහා යෝජනා 2ක් ලැබිණි. කොතලාවල ආරක්ෂක පීඨය විසින් ඉදිරිපත් කරනු ලැබූ වකුගඩු රෝගය සඳහා ලෝහ හේතුකාරක වී ඇති බවට වන සැකය යාන්ත්‍රික උපක්‍රම භාවිතයෙන් තහවුරු කිරීමේ යෝජනාව ඇගැයීමට ලක් කොට මූල්‍යනය සඳහා තෝරාගනු ලැබිණි. මෙම පර්යේෂණය සඳහා රු. මිලියන 3.9 ක මුදලක් අනුමත වී ඇත.

### 3.1.2 ද්විපාර්ශ්විය සහයෝගීතාවය

- **ඉන්දු ශ්‍රී ලංකා ඒකබාද්ධ පර්යේෂණ වැඩසටහන**

අමාත්‍යාංශය විසින් 2011 සැප්තැම්බර් මස දී ඉන්දියාවේ විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සහයෝගීතා වැඩසටහනකට එළැඹි අතර මෙම වැඩසටහන යටතේ දෙරටෙහිම විද්‍යාඥයින් හට ඒකාබද්ධ සහයෝගීතා පර්යේෂණ සහ වැඩමුළු සඳහා සහභාගී වීමේ අවස්ථාව උදාවේ. මෙම වැඩසටහන යටතේ පර්යේෂණ ව්‍යාපෘති 9ක් ආරම්භ කරන ලද අතර මෙහි දෙවන ප්‍රගති සමාලෝචනය 2015 ජූලි 10 දින අමාත්‍යාංශයේ දී පවත්වන ලදී.

මෙම ප්‍රගති සමාලෝචන රැස්වීමේ දී "ඉස්සන් වගාවෙහි සුදු ලප සහලක්ෂණ වයිරසය පාලනය සඳහා යොදාගත හැකි ප්‍රතිසංයෝජිත ප්‍රෝටීන එන්නත නිපදවීම සඳහා ජෛවභායන නිනිති ද්‍රව්‍යයන් භාවිතා කිරීමේ හැකියාව" පිළිබඳ ව්‍යාපෘතිය ඵලදායක ප්‍රතිඵලයක් නොපෙන්වූ හෙයින් එම ව්‍යාපෘතියේ ශ්‍රී ලංකික අන්වේෂක

විසින්, සිය ඉන්දියානු සගයාගේ එකඟතාවය යටතේ එම ව්‍යාපෘතිය කල්පිරීමට පෙර අවසන් කරන ලෙස ඉල්ලා සිටි හෙයින් එම ව්‍යාපෘතිය කල්පිරීමට පෙර අවසන් කරන ලදී.

"මුහුදු මට්ටමේ ඉහළයාම දූපත් සඳහා සහ වැසියන්ගේ ජීවිකාව සඳහා බලපාන අයුරු තක්සේරු කිරීම සඳහා ක්‍රමවේද වැඩිදියුණු කිරීම" පිළිබඳ ව්‍යාපෘතියෙහි ප්‍රධාන අන්වේෂක විසින්, එකඟ වූ අයවැයට බලපෑමක් නොවන පරිදි එම ව්‍යාපෘතිය දීර්ඝ කරන ලෙස ඉල්ලා සිටින ලදී. මෙම දීර්ඝ කිරීම අනුමත කිරීමට පෙර දීර්ඝ කරනු ලබන කාලසීමාව සඳහා කාර්ය සැලසුමක් ඉදිරිපත් කරන ලෙස ඇගැයීම්කරුවන් විසින් ඉල්ලා සිටින ලදී.

- **ඉන්දියානු විද්‍යාත්මක සහ පර්යේෂණ අධිශිෂ්‍යත්ව වැඩසටහන (ISRF)**

ඉන්දියානු විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය විසින් "ඉන්දියානු විද්‍යාත්මක සහ පර්යේෂණ අධිශිෂ්‍යත්ව වැඩසටහන (ISRF)" හරහා ශ්‍රී ලංකික විද්‍යාඥයින් සහ පර්යේෂකයින් සඳහා අධිශ්ෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වැඩසටහනක් ආරම්භ කරනු ලැබිණි. එවක පැවති තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශ වෙබ් අඩවිය, ජාතික විද්‍යා පදනමෙහි වෙබ් අඩවිය සහ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසමෙහි වෙබ් අඩවියෙහි මෙම වැඩසටහන පිළිබඳ තොරතුරු පළකරනු ලැබූ අතර, පුවත්පත් හි දැන්වීම් ද පළකරනු ලැබිණි.

අයැදුම්පත් 6ක් ලද අතර විශේෂඥ ඇගැයීමකින් අනතුරුව අයැදුම්පත් 4ක් ඉන්දියානු බලධාරීන් වෙත අනුමැතිය ලබාගැනීම සඳහා යවන ලදී. එම අයැදුම්පත් 4 අතුරින්, ඖෂධවේදය සහ බෝගවිද්‍යාව පිළිබඳ අයැදුම්පත් 3ක් තෝරාගනු ලැබිණි.

- **ඒකාබද්ධ විද්‍යාගාරයක් ස්ථාපනය කිරීම සහ දක්ෂතා සහිත තරුණ විද්‍යාඥයින් හුවමාරු කිරීමේ වැඩසටහන (TYSP) පිළිබඳ ශ්‍රී ලංකාව සහ මහජන චීන සමුහාණ්ඩුව අතර ඇතිකර ගනු ලැබූ අවබෝධතා ගිවිසුම**

උසස් අධ්‍යාපන සහ පර්යේෂණ ගරු අමාත්‍ය ආචාර්ය සරත් අමුණුගම මැතිතුමන් චීනයේ, කුන්මින්ග් ප්‍රදේශයේ කළ සංචාරය අතර තුරදී ශ්‍රී ලංකා රාජයේ තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සහ මහජන චීන සමුහාණ්ඩුවේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය අතර, ඒකාබද්ධ විද්‍යාගාරයක් ස්ථාපනය කිරීම සහ දක්ෂතා සහිත තරුණ විද්‍යාඥයින් හුවමාරු කිරීමේ වැඩසටහන පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීම 2015 ජුනි 12 දින සිදුකරන ලදී.

කාර්මික තාක්ෂණ ආයතනය විසින් සිය පරිශ්‍රය තුළ මෙම ඒකාබද්ධ විද්‍යාගාරය ස්ථාපනය කිරීමට කැමැත්ත ප්‍රකාශ කොට ඇත.

මෙම වැඩසටහන අඛණ්ඩව සිදුකිරීම සඳහා TYS වැඩසටහනෙහි කාර්ය කණ්ඩායම සඳහා සාමාජිකයින් තිදෙනෙකු, ජාතික විද්‍යා පදනම විසින් පත්කරන ලදී.

- **BIMSTEC තාක්ෂණ පැවරුම් පහසුකම් ස්ථාපනය කිරීම පිළිබඳ තෙවැනි විශේෂඥ කණ්ඩායම් හමුව.**

නැස්ටෙක් ආයතනයේ සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන්, BIMSTEC තාක්ෂණ පැවරුම් පහසුකම ස්ථාපනය කිරීම පිළිබඳ තෙවැනි විශේෂඥ කණ්ඩායමේ හමුව, 2015 අගෝස්තු මස 25-26 යන දිනයන්හි දී කොළඹ දී පවත්වන ලදී. මෙම අවස්ථාව සඳහා BIMSTEC සාමාජික රටවල්හි සමාජිකයින් 9 දෙනෙක් සහභාගී විය.

නැස්ටෙක් ආයතනයේ සභාපති මහාචාර්ය ධම්මික තන්ත්‍රිගොඩ මහතා විසින් ශ්‍රී ලංකා නියෝජිත මණ්ඩලයේ නායකත්වය දරනු ලැබූ අතර BIMSTEC මහලේකම් කාර්යාලයේ මහ ලේකම් H. E. සුමිත් නාකන්දල මහතා ද මෙම අවස්ථාවට සහභාගී විය.

තාක්ෂණ පැවරුම් පහසුකම ස්ථාපනය කිරීම සඳහා වන සමාගම් ගිවිසුමෙහි (MOA) අවසන් කෙටුම්පත, පුළුල් සාකච්ඡාවන් ගණනාවකින් අනතුරුව සකස් කරනු ලැබූ අතර ඉන්දියාව විසින් මතුකරනු ලැබ ඇති කරුණු ඇතුලත් කිරීමෙන් පසු සකසා අවසන් කරනු ඇත.

- **සාක් කලාපය සඳහා චන්ද්‍රිකාවක්**

ඉන්දියානු අග්‍රාමාත්‍යවරයා විසින් සිදුකරනු ලැබූ ප්‍රකාශයක් සඳහා සිදුකරන ලද පසුවිපරමක් ලෙස ඉන්දියාව විසින් "සාක් කලාපය සඳහා චන්ද්‍රිකා සහ අභ්‍යවකාශ තාක්ෂණ යෙදවුම්" පිළිබඳ වැඩමුළුවක් සඳහා සියලු සාමාජික රටවලින් නියෝජිත කණ්ඩායම් 5ක් වෙත ඇරයුම් කරන ලද 2015 ජුලි 06 දින මෙම වැඩමුළුව නව දිල්ලියේ දී පවත්වන ලදී. නවීන තාක්ෂණය පිළිබඳ ආතර්. සී ක්ලාක් ආයතනයේ සහ විදුලි සංදේශ නියාමන කොමිසමෙහි නියෝජිතයන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් ශ්‍රී ලංකාව නියෝජනය කරමින් මෙම අවස්ථාව සඳහා සහභාගි විය.

## 3.2 ජාතික නිනිති තාක්ෂණ මුලාරම්භය

### 3.2.1 සී/ස ශ්‍රී ලංකා නිනිත තාක්ෂණ ආයතනය (පෞද්) සමාගම (ස්ලින්ටෙක්)

සී/ස ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය (ස්ලින්ටෙක්) පෞද් සමාගම යනු ශ්‍රී ලංකා රජය සහ පෞද්ගලික අංශයේ ප්‍රධාන පෙළේ සමාගම් 5ක් එනම් MAS, බ්‍රැන්ඩික්ස්, හේලීස්, ඩයලොග් ඇක්සියාටා සහ ලෝඩ්ස්ටාස් යන සමාගම් අතර ඇති කර ගනු ලැබූ රාජ්‍ය - පෞද්ගලික සහයෝගීතාවයන් හරහා 2008 වසරේදී පිහිටුවාගත් පෞද්ගලික සමාගමකි. 2014 වසරේදී ලංකෙම් සමාගම මෙහි කොටස් හිමිකරුවෙකු විය.

නිනිති තාක්ෂණය සහ උසස් තාක්ෂණ පර්යේෂණ පිළිබඳ සුවිශේෂිත්වයක් දක්වමින් පර්යේෂණයන්හි නිරත වී සිටින ස්ලින්ටෙක් සමාගම දේශීය නිෂ්පාදනයන් වඩා තරඟකාරී අයුරින් ලෝක වෙළඳපොළ වෙත ඉදිරිපත් කිරීම පිළිබඳ සිය අවධානය යොමු කොට ඇත. තවද ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් සඳහා වටිනාකම් එක්කිරීමේ ව්‍යාපෘතීන් කිහිපයක්ද ස්ලින්ටෙක් විසින් ක්‍රියාත්මක කෙරේ. ශ්‍රී ලංකාවේ නිනිති තාක්ෂණ සහ උසස් තාක්ෂණ පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන අංශයේ කේන්ද්‍රස්ථානය වන නිනිති තාක්ෂණ සහ විද්‍යා උද්‍යානය වැඩිදියුණු කිරීමේ කාර්යය ස්ලින්ටෙක් වෙත පැවරී ඇත.



විශිෂ්ටත්ව මධ්‍යස්ථානය

ස්ලින්ටෙක් සමාගම පර්යේෂණ සහ සංවර්ධන සඳහා වෙන්වූ අංශයක් ලෙස නිර්මාණය වී ඇති අතර රාජ්‍ය - පෞද්ගලික සහයෝගීතාවයක් ලෙස ස්ථාපනය කොට ඇති මෙහි 50% ක කොටස් හිමිකාරිත්වයක් රජය විසින් ද ඉතිරි 50% පෞද්ගලික අංශය විසින් ද දරනු ලැබේ.

ජාතික ආර්ථික සංවර්ධනය සඳහා සැලකිය යුතු අන්දමින් දායකත්වය දක්වමින්, ශ්‍රී ලංකීය පර්යේෂණ සහ සංවර්ධන කර්මාන්තය තුළ වෙනස්කම් සිදුකිරීම සහ ජාත්‍යාන්තර මට්ටමේ නවෝත්පාදන වේදිකාවන් නිර්මාණය කිරීම ආරම්භයේ සිටම මෙම සමාගම විසින් ප්‍රයත්න දරනු ලැබිණි.

### 3.2.2 පර්යේෂණ සහ සංවර්ධන/වාණිජකරණය/තාක්ෂණ පැවරුම්

| පර්යේෂණ සහ සංවර්ධන ක්ෂේත්‍රය | දැනුම නිර්මාණයෙහි තත්ත්වය | වාණිජකරණය/තාක්ෂණ පැවරුම්හි තත්ත්වය |
|---|---|---|
| කෘෂි කර්මාන්තය | එක්සත් ජනපදයේ පේටන්ට් බලපත්‍ර 11 ක් සඳහා අයදුම් කරන ලදී | එ. ජ ඩොලර් මිලියන 1කට ආසන්න මුදලකට පේටන්ට් බලපත්‍ර 3ක් අලෙවි කරන ලදී. ඉන්දියානු හවුල්කරු සමඟ, මෙම විසඳුමෙහි පිරිවැය ඵලදායීතාවය පිළිබඳ සමාලෝචනයක් සිදු කිරීමට අත්හදා බැලීම් සිදුකෙරේ. නැනෝ පොහොර පිළිබඳ දිවයින පුරා අත්හදා බැලීම් දැනට සිදුකෙරේ. පොහොර පිළිබඳ නව ක්ෂේත්‍රයන් සහ සේවාදායක සහයෝගීතා ව්‍යාපෘති කිහිපයක්ද සාකච්ඡා මට්ටමේ පවතී. |
| ජල පවිත්‍රකරණ | දැනුම හුවමාරුකිරීම ග්‍රැෆීන් මත පදනම් වු නව ජල පෙරනය | අඩු වියදම් ජල පෙරන නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් වැඩිදියුණු කරනු ලැබ පරීක්ෂාවන් සිදු කෙරෙමින් පවතී උග්‍ර වකුගඩු රෝගය පවතින ප්‍රදේශ සඳහා ජල පෙරණ 50ක් පරීක්ෂාවන් සිදු කිරීම සඳහා ලබාදීමට නියමිතය. |
| ඇඟළුම් | පේටන්ට් බලපත්‍ර 2ක් අයදුම් කරනු ලැබ ඇති අතර එක්සත් ජනපද පේටන්ට් බලපත්‍ර සඳහා අයදුම් කිරීම සඳහා තවත් බලපත්‍ර 2ක් කෙටුම්පත් කෙරෙමින් පවතී. | ප්‍රධාන පෙළේ නිෂ්පාදන සමාගමක් වෙත මෙම තාක්ෂණය සාර්ථකව පවරාදෙනු ලැබ ඇති අතර දැනට කතෘභාග ආදායම් උපයාගැනේ මෙම අංශය සමඟ අඛණ්ඩව කටයුතු කෙරෙන අතර අවසන් වීමට ආසන්න ප්‍රධාන ව්‍යාපෘතීන් 2ක් පවතී. ඉන් එක් ව්‍යාපෘතියක් ප්‍රබල වාණිජකරණ හැකියාවන් පෙන්වන අතර ඒ පිළිබඳ සාකච්ඡාවන් දැනට සිදුකෙරේ. |
| සෞඛ්‍යාරක්ෂණ | ශ්‍රී ලංකීය දේශීය පැළෑටීන්හි වටිනාකම් හඳුනාගැනීම සඳහා පර්යේෂණ කිහිපයක් සිදුකිරීම. | චර්මාලේපන සැකසීම පිළිබඳබ පර්යේෂණ සිදුකිරීම සම්බන්ධව කර්මාන්ත අංශයේ හවුල්කරුවෙකු සමග සාකච්ඡාවන් සිදුකෙරේ. |
| ඛණිජ සම්පත් | ඉල්මනයිට්, ටයිටේනියම් ඩයොක්සයිඩ් බවට පරිවර්තනය කිරීම ග්‍රැෆයිට්, ග්‍රැෆීන් ඔක්සයිඩ් බවට පරිවර්තනය කිරීම සහ මැටි, මොන්ට්මොරිලොනයිට් බවට පරිවර්තනය කිරීම. | ටයිටේනියම් ඩයොක්සයිඩ් පිළිබඳ නියාමක බලාගාර කටයුතු සම්පූර්ණ කරනු ලැබ ඇති නමුත් අවසාන ඵලයෙහි යම් පැහැය වෙනස්වීමක් දක්නට ලැබිණි. අවසන් විශ්ලේෂණ කටයුතු සිදුකෙරෙමින් පවතී. ග්‍රැෆයිට් පිළිබඳ නියාමක බලාගාරය ඉදිකොට ඇත. නියාමක බලාගාර සඳහා වැයවන මුදල දැනට සාධාරණීකරණය කළ නොහැකි හෙයින් මැටි ව්‍යාපෘතිය දැනට අත්හිටුවා ඇත. |
| කෘත්‍රිම රසායන විද්‍යාව සහ කෘත්‍රිම ජෛව විද්‍යාව | විද්‍යාගාරයන් සියලු උපකරණයන්ගෙන් සමන්විත කර ඇත. | සේවා දායකයින් දෙදෙනෙකු වෙතින් පළමු ප්‍රබල උනන්දුව හේතුවෙන් නිශ්චිත ක්‍රියාකාරී ඖෂධ විද්‍යාත්මක ද්‍රව්‍ය (API) ගණනාවක් කෘත්‍රිමකරණය කිරීම පිළිබඳ අවධානය යොමුවී ඇත. කෘත්‍රිමකරණය කරනු ලැබූ API සාර්ථකව ප්‍රදර්ශනය කිරීමෙන් අනතුරුව ගිවිසුම සම්පූර්ණ කිරීම අපේක්ෂිතය. |
| කුරුඳු මත පදනම් වු පෝෂණීය ආහාර අතිරේකය | පර්යේෂණ සම්පූර්ණ කරනු ලැබ ඇත. | සේවාදායකයා විසින් විදේශීය හවුල්කරු වෙත මූලික නිෂ්පාදනය පෙන්වනු ලැබිණි. නියාමක බලාගාරය වැඩි දියුණු කෙරේ. |
| ජල විකර්ශන වේදිකාව | එක්සත් ජනපද පේටන්ට් බලපත්‍රය. | සේවාදායක පරිශ්‍රයන්හිදී පරීක්ෂණ අත්හදා බැලීම් සිදුකෙරේ. |
| ක්‍රියාකාරී සුහුරු රබර් අත්වැසුම් | සේවාදායකයා සමඟ නිෂ්පාදන පිළිබඳ සාකච්ඡාවන් සිදුකෙරේ. | අත්වැසුම් නිෂ්පාදක සමඟ සාකච්ඡාවන් සිදු කෙරේ. |

| | | |
|---|---|---|
| වැඩිදියුණු කරනු ලැබූ ලිහිස්සි ද්‍රව්‍ය හරහා ශක්ති කාර්යක්ෂමතාව | පර්යේෂණ සම්පූර්ණ කරනු ලැබ ඇත. | සාකච්ඡාවන් සිදුකෙරේ. සේවාදායකයා සමඟ වෙළඳපළ පරීක්ෂණයන් සිදුකෙරේ. |
| තාප - පරිවරණය | පර්යේෂණ සිදුකෙරේ | නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා සේවාදායකයින් මත පදනම් වූ ව්‍යාපෘතිය. |
| සෙවිළි තහඩු ලෙස ඇස්බැස්ටෝස් භාවිතය වෙනුවට විකල්පයක් භාවිතය | පර්යේෂණ සිදුකෙරේ | රජය විසින් 2018 වසරේ සිට ඇස්බැස්ටෝස් භාවිතය තහනම් කිරීමේ නිවේදනය නිකුත් කිරීමට වසරකට පෙර සේවාදායකයා විසින් ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. |

## 3.3 නව නිපැයුම්කරුවන්ගේ අරමුදල

- පහත සඳහන් නව නිපැයුම්කරුවන්හට සිය නව නිපැයුම් වාණිජකරණය කිරීම සඳහා මූල්‍යමය වශයෙන් සහාය ලබාදෙනු පිණිස නව නිපැයුම්කරුවන්ගේ අරමුදල භාවිතා කරන ලදී.

| නව නිපැයුමෙහි/නවෝත්පාදනයෙහි වර්ගය | මූල්‍යමය දායකත්වය |
|---|---|
| ඉහළ දැමිය හැකි වැසිකිළි අසුන ඇතුළත් වූ විකලාංග උපකරණ | රු. මිලියන 8.95 |
| “GOLE” කාබනික පොහොර | |
| ස්වයංක්‍රීය වොල්ටීයතා ආරක්ෂක පද්ධතිය | රු. මිලියන 0.4 |

- වාණිජකරණය සඳහා ලබාදීම සඳහා ඇතිකරගනු ලැබූ අපගේ සහයෝගීතා ගිවිසුම හා අනුකූලව හේමාස් හෝල්ඩිං සමාගම විසින් පහත නව නිපැයුම් තෝරාගනු ලැබ ඇත. මේ හරහා, වෙළඳපළ යාන්ත්‍රණයන්ට සාර්ථකව මුහුණදීම සඳහා පෞද්ගලික අංශයේ සහායය ලබාගැනීමේ අවස්ථාව, නව නිපැයුම්කරුවන් වෙත උදාවේ.

| නව නිපැයුම්කරුගේ නම | නව නිපැයුම |
|---|---|
| ආචාර්ය කේ. ටී. ඩී. කහඳුව සහ මහාචාර්ය එස්. එම්. විජේරත්න | දියවැඩියාවෙන් පෙළෙන රෝගීන්ගේ පාද සඳහා උෂ්ණත්ව සහ කම්පන සංවේදී උපකරණය |
| ආචාර්ය ආර්. එම්. එච්. එම්. ඒ. අයි. හේරත් | ඉහළ ක්‍රියාකාරීත්වයෙන් යුක්ත පර්යන්ත ස්නායු උත්තේජන ඉදිකටුව |
| ආර්. එම්. එස්. බී. හුනුකුඹුර | වායුරෝධක අගුලක් සහිත නිදහසේ චලනය කළ හැකි කෘත්‍රිම පාදය |
| ජී. ඩී. ඒ. එල්. සෙනෙවිරත්න | ආයුර්වේද ජල චිකිත්සක පද්ධතිය |





- ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් “සමේ රෝග සඳහා ඖෂධීය ආලේපය” යන නව නිපැයුම් Lanka Angel Network (LAN) වෙත හඳුන්වා දෙනු ලැබූ අතර එම නව නිපැයුම වාණිජකරණය කරනු පිණිස ආරම්භක ප්‍රාග්ධනය ලබාදීම සඳහා LAN විසින් තෝරාගනු ලැබිණි. වෙන්කර දී ඇති මුළු මුදල එ.ජ.ඩො. 120,000න් පලමු කොටස ලෙස එ.ජ.ඩො. 65000ක් ලබදී ඇති අතර මේ සඳහා සුදුසු බිම් කැබැල්ලක්ද හඳුනාගනු ලැබ කුරුණෑගල ආයෝජන සංගමය විසින් මුලාධාර ලබාදී ඇත.




LAN සහාය ලබාදීමට ප්‍රතිඥ දෙමින් LAN ආයෝජකයෙකු වෙතින් සැකි ලතීෆ් කුසලාන ලබමින්

- බ්‍රැන්ඩික්ස් සමාගම විසින් ආරම්භ කරන ලද DISRUPT – A – THON ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් හැකියාවන් සහිත නව නිපැයුම්කරුවන් හඳුන්වා දෙනු ලැබිණි. මෙම ව්‍යාපෘතිය මගින් “Smart Intelligent Jacket” යන නව නිපැයුම නිෂ්පාදනය කරනු ලැබූ අයිමන් පිරෝස්, සහාය ලබාදීම සඳහා හඳුනාගනු ලැබූ අතර “Generation Epsilon (Pvt) Ltd” යන නමින් බ්‍රැන්ඩික්ස් සමාගමට අනුබද්ධ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා සහායය ලබාදෙන ලදී.

- සහසක් නිමැවුම් ප්‍රදර්ශනයේදී ලද පිළිගැනීම “KAPLA” විදුලි මෝටර් රථ නිෂ්පාදන ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කිරීමේ දී, කපිල ද සිල්වා හට මහෝපකාරී විණි.

- ජිනසේන සමාගම් සමූහයේ සහයෝගීතාවයෙන්, විදුලි බලය නොමැති දුෂ්කර ප්‍රදේශයන්හි අඩු ආදායම්ලාභී පවුල් සඳහා සූර්යබලයෙන් ක්‍රියාත්මක වන කියවීම් පහන් බෙදාදෙන ලදී. මෙම කාලපරිච්ඡේදය තුළ සූර්ය බලයෙන් ක්‍රියාත්මක කියවීම් පහන් 215ක් අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයන්හි බෙදාදෙන ලදී.

- ස්වාධීන රූපවාහිනී නාලිකාවේ විකාශනය කෙරෙන “Young Inventors Club” රූපවාහිනී වැඩසටහන මගින් නිශ්චිත කාල සීමාවක් තුළ ක්ෂණික ගැටලුවක් සඳහා තාක්ෂණික විසඳුමක් ලබාදීමට සිසුන්ට අභියෝග කෙරිනි. මේ සඳහා ලැබෙන හොඳම විසඳුම් තෝරාගනු ලැබීමෙන් අනතුරුව ජයග්‍රහණය ලබාගත් කණ්ඩායම් සඳහා වඩා සංකීර්ණ ගැටලු ඉදිරිපත් කරනු ලැබූ අතර ඒ සඳහා විසඳුම් ලබාදීමට අභියෝග කෙරිනි. අවසන් ජයග්‍රාහී කණ්ඩායම් 02ක් තෝරාගනු ලැබූ අතර අවසන් මහා තරඟයේදී ජයග්‍රහණය ලද කණ්ඩායම විසින් “Young Inventors Club” කුසලානය හිමිකරගන්නා ලදී. මෙම වැඩසටහන කොටස් 13කින් සමන්විතවූ අතර මෙහි අවසන් වැඩසටහන 2015 අප්‍රේල් 09 දින බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. තාක්ෂණික ගැටලු සඳහා විසඳුම් සොයාගනු පිණිස රොබෝවිද්‍යා තාක්ෂණය භාවිතා කිරීම සඳහා ශිෂ්‍යයින් පුහුණු කෙරිණි. මෙහිදී ජයග්‍රහණය හිමිකරගත් කණ්ඩායම සඳහා, ප්‍රථම වරට 2015 නොවැම්බර් මසදී පැවැත්වූ ලෝක රෝබෝවිද්‍යා ඔලිම්පියාඩ් (WRO) තරඟය සඳහා සහභාගීත්වය දක්වනු පිණිස සහයෝගීත සංවිධානය සහ SLIC විසින් අනුග්‍රහාකත්වය දක්වන ලදී.

- “සහසක් නිමැවුම්” ජාතික නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රදර්ශනය.
2015 ශ්‍රී ලංකා ප්‍රදර්ශන සහ සම්මේලන මධ්‍යස්ථානයේදී 2015 සැප්තැම්බර් 26 – 28 දක්වා සාර්ථකව පවත්වනු ලැබිණි.

## 3.4 තාක්ෂණ පැවරුම් - විදාතා වැඩසටහන

තාක්ෂණ පැවරුම් (විදාතා) වැඩසටහනෙහි අරමුණ වනුයේ දිවයින පුරා පිහිටුවා ඇති විදාතා සම්පත් මධ්‍යස්ථාන හරහා බිම් මට්ටමේ සිට ක්ෂුද්‍ර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙත විද්‍යාත්මක දැනුම සහ පර්යේෂණ නවෝත්පාදනයන් පවරාදීමයි. 2004 වසරේදී ආරම්භ කරනු ලැබූ විදාතා වැඩසටහන, ග්‍රාමීය ආර්ථිකය ඉහළ නංවමින්, ජාතික ආර්ථික සංවර්ධනය සඳහා එමඟින් ලැබෙන දායකත්වය වර්ධනය කිරීමේ පරමාර්ථයන් ආරම්භ කරන ලදී. ග්‍රාමීය ජනතාවගේ නිර්මාණශීලී සහ කුසලතා හැකියාවන්, ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සඳහා දායක කර ගැනීමටද මේ හරහා අපේක්ෂා කෙරේ. මෙම අරමුණ සපුරාගනු වස් ග්‍රාමීය ප්‍රජාවගේ තත්ත්වයෙන් උසස් නිෂ්පාදන, වෙළඳපළ වෙත හඳුන්වාදීම හරහා ග්‍රාමීය ජනතාව වෙත ස්ථාවර ආදායමක් සහතික කිරීමද මෙම වැඩසටහන තුළින් අපේක්ෂිතය.

මෙම වැඩසටහන හරහා ප්‍රාථමික තාක්ෂණයන් නොමිලේ පවරාදෙනු ලබන අතර, ද්විතීයික තාක්ෂණයන් ඉතා සුළු මුදලකටද, තෘතීයික තාක්ෂණයන් සාධාරණ මුදලකටද පවරාදෙනු ලැබේ. වර්තමානයේදී, විදාතා සම්පත් මධ්‍යස්ථාන 266ක් 900ක පමණ පිරිස් බලයෙන් දිවයිනපුරා ක්‍රියාත්මක වේ.

විදාතා මධ්‍යස්ථානයන්හි පළාත් සහ දිස්ත්‍රික් මට්ටමේ බෙදීයාම වගුව 1 සහ වගුව 2 ඇසුරෙන් පෙන්නුම් කෙරේ.

වගුව 1- පළාත් මට්ටමින් විදාතා මධ්‍යස්ථානයන්හි බෙදීයාම

| පළාත | ප්‍රා: ලේ: | වි: ස: ම: | % |
|---|---|---|---|
| මධ්‍යම | 36 | 33 | 91.67 % |
| නැගෙනහිර | 45 | 25 | 48.89 % |
| උතුරු මැද | 29 | 21 | 72.41 % |
| උතුරු | 33 | 14 | 39.39 % |
| වයඹ | 46 | 37 | 80.43 % |
| සබරගමුව | 28 | 28 | 100.00 % |
| දකුණු | 47 | 47 | 100.00 % |
| ඌව | 26 | 21 | 80.77 % |
| බස්නාහිර | 40 | 40 | 100.00 % |
| **මුළු ගණන** | **330** | **266** | **80.60 %** |

වගුව2 : දිස්ත්‍රික්ක මට්ටමින් විදාතා මධ්‍යස්ථානයන්හි බෙදීයාම

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රා: ලේ: කොට්ඨාසය | වි: ස: ම: | % |
|---|---|---|---|---|
| මධ්‍යම | නුවර | 20 | 20 | 100.00 % |
| මධ්‍යම | මාතලේ | 11 | 9 | 81.82 % |
| මධ්‍යම | නුවරඑළිය | 5 | 4 | 80.00 % |
| නැගෙනහිර | අම්පාර | 20 | 14 | 70.00 % |
| නැගෙනහිර | මඩකලපුව | 14 | 9 | 64.28 % |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | 11 | 2 | 18.18 % |
| උතුරු මැද | අනුරාධපුර | 22 | 17 | 77.27 % |
| උතුරු මැද | පොළොන්නරුව | 7 | 4 | 57.14 % |
| උතුරු | යාපනය | 15 | 8 | 53.33 % |
| උතුරු | කිලිනොච්චි | 4 | 0 | 0.00 % |
| උතුරු | මන්නාරම | 5 | 4 | 80.00 % |
| උතුරු | මුලතිව් | 5 | 0 | 0.00 % |
| උතුරු | වවුනියා | 4 | 2 | 50.00 % |
| වයඹ | කුරුණෑගල | 30 | 26 | 86.67 % |

| | | | | |
|---|---|---|---|---|
| වයඹ | පුත්තලම | 16 | 11 | 68.75 % |
| සබරගමුව | කෑගල්ල | 11 | 11 | 100.00 % |
| දකුණු | රත්නපුර | 17 | 17 | 100.00 % |
| දකුණු | ගාල්ල | 19 | 19 | 100.00 % |
| දකුණු | හම්බන්තොට | 12 | 12 | 100.00 % |
| දකුණු | මාතර | 16 | 16 | 100.00 % |
| ඌව | බදුල්ල | 15 | 12 | 80.00 % |
| ඌව | මොණරාගල | 11 | 9 | 81.82 % |
| බස්නාහිර | කොළඹ | 13 | 13 | 100.00 % |
| බස්නාහිර | ගම්පහ | 13 | 13 | 100.00 % |
| බස්නාහිර | කළුතර | 14 | 14 | 100.00 % |

සෑම වි. ස. මධ්‍යස්ථානයක් සතුව විද්‍යා හා තාක්ෂණ නිලධාරී (STO), ක්ෂේත්‍ර සම්බන්ධීකාරක, පරිගණක ක්‍රියාකරු සහ කාර්යාල කාර්ය සහායක යන නිලධාරීන්ගෙන් සැදුම් ලත් කාර්ය මණ්ඩලයක් ඇත. විදාතා සම්පත් මධ්‍යස්ථානයන්හි මූලික පුහුණු පහසුකම් සහ බේකරි උදුන, එළවළු විජලන යන්ත්‍රය සහ සුදු පොල් තෙල් නිස්සාරණ යන්ත්‍රය වැනි උපකරණය පවතී. අදාළ ජන ප්‍රජාවගේ අවශ්‍යතාවන් සහ ප්‍රදේශයේ පවතින සම්පත්හි බහුලතාවය මත පදනම්ව තාක්ෂණ පැවරුම් වැඩසටහන් හඳුනාගනු ලැබේ. විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්ගේ මාර්ගෝපදේශකත්වය යටතේ, ක්ෂේත්‍ර සම්බන්ධීකාරක විසින් සිදුකරනු ලබන තාක්ෂණ අවශ්‍යතා ඇගැයීමක් සමග මෙම ක්‍රියාවලිය ආරම්භ කෙරේ. ඉන් අනතුරුව අදාළ වි. ස. මධ්‍යස්ථානයේ විදාතා හා තාක්ෂණ නිලධාරී විසින් සහ ITI, NERD හා CIMT වැනි අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක පර්යේෂණ ආයතන සහ වෙනත් අදාළ තාක්ෂණ සැපයුම්කරුවන් විසින් සිදු කරනු ලබන පුහුණු සැසි හරහා යෝග්‍ය තාක්ෂණයන් පවරාදෙනු ලැබේ.

තාක්ෂණ පැවරුම් හා අදාළව ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන්හි සාරාංශය පහත පදිරි වේ.

| වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගීවූවන් සංඛ්‍යාව |
|---|---|---|
| **1. ප්‍රජාව සඳහා තාක්ෂණය** | | |
| **1.1. ප්‍රජාවන්හි බිම්මට්ටම දක්වා තාක්ෂණික ප්‍රගතීන්හි ප්‍රතිලාභ ලබාදීම** | | |
| අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලමට්ටමින් සහ ජාතික මට්ටමින් පවත්වනු ලබන විදාතා සංසද හරහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හා සම්බන්ධිත ගැටලු හඳුනාගැනීම සහ නිරන්තර සබඳතාවය | | |
| **2. ව්‍යවසායකයින් සඳහා තාක්ෂණය** | | |
| **2.1. දැනුම්වත් කිරීම සහ ධාරිතා ගොඩනැංවීම** | | |
| අ) ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ජාතික තාක්ෂණ මූලාරම්භය යටතේ මහජන දැනුවත් කිරීමේ වැඩසටහන සහ තාක්ෂණ දැනුවත් කිරීමේ වැඩසටහන් | 3294 | 100006 |
| ආ) ප්‍රජා නියෝජිතයන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීම/ හඳුනාගත් ව්‍යවසායක හැකියාවන් සහිත කුඩා කණ්ඩායම් සඳහා තාක්ෂණ පැවරුම් වැඩසටහන් පැවැත්වීම. | 5287 | 129282 |
| ඇ) දිස්ත්‍රික් මට්ටමින් තාක්ෂණ සහ මානව සම්පත් සහකාර නිලධාරීන් හරහා ව්‍යවසායකයින් සඳහා කළමනාකරණය, මූල්‍යනය, ඇසුරුම්කරණය, 5S, සහ උසස් තත්ත්වය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම. | 462 | 19363 |
| **2.2 ප්‍රමිතිකරණය සහ ව්‍යවසායකයින් පිළිගැනීමට ලක් කිරීම** | | |
| අ) විදාතා පද්ධති සහතිකරණය /GMP/SLS/ISO සඳහා සුදුසු ව්‍යාවසායකයින් හඳුනා ගැනීම | ව්‍යවසායකයින් 371ක් හඳුනා ගනු ලැබ ඇත | |
| 2.3 අලෙවිකරණ සහාය | | |
| අ) විදාතා හරිත කඩමණ්ඩිය සහ එළිමහන් අලෙවිපොළ | කාර්මික තාක්ෂණ ආයතන පරිශ්‍රයේදී “හරිත කඩමණ්ඩිය” පැවැත්වීම | |

| | | |
|---|---|---|
| **3. අනාගත පරපුර සඳහා තාක්ෂණය** | | |
| **3.1. අනාගත පරපුර සඳහා තාක්ෂණික නවෝත්පාදනයන් පිළිබඳ ධාරිත වර්ධනය සහ දැනුම නිර්මාණය** | | |
| අ). "ප්‍රභාස්වර" බ්ලොග් පිටුව සඳහා ලිපි සැපයීම | බ්ලොක් ලිපි 271 | |
| ආ). පාසැල්හි පවත්වනු ලැබූ දැනුම්වත් කිරීමේ වැඩසටහන් | 295 | 7670 |
| **4. විද්‍යා හා තාක්ෂණික නිලධාරින් සඳහා විද්‍යාත්මක පුහුණුව** | | |
| 4.1 **විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් සඳහා විද්‍යාත්මක පුහුණුව** | 06 | 06 |

**විද්‍යාව ප්‍රචලිත කිරීම**

- තරුණ පරපුර අතර තාක්ෂණය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සිසුන් 16,836කගේ සහභාගීත්වයෙන් පාසැල් මට්ටමින් දැනුම්වත් කිරීමෙ වැඩසටහන් 732ක් පවත්වන ලදී.
- ප්‍රභාස්වර අන්තර්ජාල වෙබ් පිටුවෙහි තාක්ෂණ නවෝත්පාදනයන් පිළිබඳ ලිපි 209ක් පළකරන ලදී.

**වෙනත් සංවර්ධන මුලාරම්භයන්**

- කළමනාකරණය, ආහාර තාක්ෂණය, පසු අස්වනු තාක්ෂණය සහ කලගුණික විපර්යාස වැනි විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ නිලධාරී 812ක් පුහුණු කරන ලදී. සිංගප්පූරු සහයෝගීතා වැඩසටහන යටතේ, විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් දෙදෙනෙකු සඳහා විදේශ පුහුණුව ලබාදෙන ලදී.

**විශේෂ ව්‍යාපෘති**

අ) 2015 වසරේදී විදාතා ප්‍රාදේශීය ව්‍යාපෘති 22ක් ආරම්භ කරනලදී.

ආ) නව නිපැයුම් 86ක් වැඩිදියුණු කිරීම සඳහා සහාය ලබාදුන් අතර එක් නව නිපැයුමක් වාණිජකරණය කරන ලදී.

ඇ) විදාතා පුවත් ලිපිය ප්‍රකාශයට පත් කරන ලදී.

**3 වන මහල, සෙත්සිරිපාය, 1 වන අදියර, බත්තරමුල්ල**
3rd Floor, Sethsiripaya, 1st Stage, Battaramulla
3 வது மாடி, செத்சிரிபாய, முதலாம் பிரிவு, பத்தரமுல்லை